# අනුරාධපුර යුගයේ පැවති අභ්‍යන්තර වෙළඳාම

එස්. ඒ. ඩී. එන්. එම්. සමරජීව
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
nilushika19930827@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාම පිළිබඳ සාධක ඓතිහාසික යුගය ආරම්භයේ සිට ම දක්නට ලැබේ. පාහියන්ගේ දේශාටන වාර්තාවට අනුව මෙරට මුල් ජනාවාස වෙළෙන්දන්ගෙන් ඇති වූ බව කියවේ. විජය කුමරු විසින් ගොඩනංවන ලද තම්මැන්නා නුවර වෙළඳ පොළක් තිබූ බවත් ඔහුගේ අමාත්‍යවරයෙකු වූ උපතිස්ස විසින් පිහිටවනු ලැබූ උපතිස්ස ග්‍රාමයේ වෙන් වෙන් වශයෙන් තනවන ලද ආපනශාලා තිබූ බවත් වංසකතාවල සඳහන් වේ. අශෝක - දේවානම්පියතිස්ස රාජ්‍ය අවධිවල ද වෙළඳාම පිළිබඳ කරුණු හෙළිකර ගත හැකිය. එමෙන්ම ලංකාවට බුදු දහම ලැබුණු ක්‍රි.පූ 3 වන සියවසේ මැදභාගය පටන් ම භික්ෂූන්වහන්සේ වෙනුවෙන් ලෙන් පූජා කළ අය අතර වෙළෙඳුන් වූ බවට තොරතුරු ඇත. මේ අවධියේ අනුරාධපුරය ඇතුළු සෑම නගරයකම වාගේ වෙළඳසැල් සහිත වීදි පිහිටා තිබූ බවට සාධක හමු වේ. වෙළඳුන් වෙනම කුලයක් ලෙස පෙනී සිටි බව ද වෙළඳ ගම් පිළිබඳව ද තොරතුරු මූලාශ්‍රයවල සඳහන් වේ. අනුරාධපුර යුගයේ මුල් භාගයේ දී රට තුළ වෙළඳාම ප්‍රාදේශීය වෙළඳ ශ්‍රේණි සතුව තිබුණු බව පෙනේ. වරාය නගර කේන්ද්‍ර කරගත් අභ්‍යන්තර වෙළඳාමක් එකල ක්‍රියාත්මක වූ බව ද හෙළිවේ. භාණ්ඩ හුවමාරු ක්‍රමය එනම් 'බාටාර් ක්‍රමය' හා 'කහවණු' නම් කාසි භාවිතය ද සිදු විය. දකුණු ඉන්දීය වෙළඳ ශ්‍රේණි ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාමේ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන ලදී.

අනුරාධපුර යුගයේ පැවති අභ්‍යන්තර වෙළඳාම, වෙළඳගම්, ජනගහනය අධික නගරයන්හි වෙළඳාමේ කේන්ද්‍රස්ථාන ඇති වූ ආකාරය, හා එම නගරයන්හි විසූ ජනතාවගේ අවශ්‍යතා වෙළඳාම තුළින් තෘප්ත වූ අයුරු, වෙළඳාම සංවිධානය වූ අයුරු අනාවරණය කිරීම මෙහි අරමුණයි. අනුරාධපුර යුගයේ වෙළඳාම පිළිබඳ තොරතුරු ප්‍රාථමික සාහිත්‍යය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඔස්සේ අධ්‍යයනය කිරීම සිදු කෙරුණි. මේ අනුව අනුරාධපුර යුගයේ මෙරට ආර්ථිකයෙහි කෘෂිකර්මාන්තය ප්‍රධාන භූමිකාව ඉටු කරනු ලැබුව ද ද්විතීය වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන රට තුළ සංසරණයට අභ්‍යන්තර වෙළඳාම වැදගත් වූ බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :- අනුරාධපුරය, ආර්ථිකය, අභ්‍යන්තර වෙළඳාම**